# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1448 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 19/11/2023<br>පැය 1115 |

# මාධ්‍ය නිවේදනය

**පොලිස් නිලධාරියෙක් මිය යාම සම්බන්ධව - දෙනියාය පොලිස් ස්ථානය.**

2023.11.16 වන දින දෙනියාය පොලිස් වසමේ පල්ලේගම ප්‍රදේශයේදී දිවා සංචාරයේ යමින් සිටි දෙනියාය පොලිස් ස්ථානයට අනුයුක්තව සිටි පොලිස් නිලධාරියෙකුට පල්ලේගම ප්‍රදේශයේ විහාරස්ථානයක වැඩ විසූ හිමිනමක් විසින් තියුණු ආයුධයකින් පහරදීම හේතුවෙන් බරපතල තුවාල ලබා දෙනියාය රෝහලට ඇතුළත් කිරීමෙන් පසු වැඩිදුර ප්‍රතිකාර සඳහා කරාපිටිය රෝහලට මාරුකර යවා තිබුණි.

පුද්ගලික ආරවුලක් හේතුවෙන් මෙම පහරදීම සිදු කර ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී තිබූ අතර කරාපිටිය රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටි එම නිලධාරියා 2023.11.19 වන අද දින උදෑසන මිය ගොස් ඇත.

**මිය ගිය නිලධාරියා දෙනියාය පොලිස් ස්ථානයේ විවිධ පැමිණිලි අංශයේ රාජකාරි කරණු ලැබූ පොලිස් කොස්තාපල් 89411 විරිත්තමුල්ල ගමගේ ධනුෂ්ක නැමති වයස අවුරුදු 37 ක් වූ උඩ ගොමඩිය, කටුවන ලිපිනයේ පදිංචි විවාහක තිදරු පියෙකි.**

මෙම අපරාධය සම්බන්ධයෙන් වයස අවුරුදු 18 ක් වූ සැකකාර හිමිනම දෙනියාය පොලිස් ස්ථානය මඟින් එදිනම අත්අඩංගුවට ගෙන 2023.11.17 වන දින මොරවක ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු 2023.11. 29 දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇති අතර දෙනියාය පොලිසිය මඟින් වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**